**ශීර්ෂය 290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ධීවර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට රු.139,800 ක ආපදා ණය ශේෂයක් පැවති නිලධාරියෙකු පෞද්ගලික හේතුවක් මත 2022 දෙසැම්බර් 30 දින දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා අස්වී තිබුණි. එම නිලධාරියාගෙන් අයවිය යුතු ණය ශේෂය සම්පූර්ණයෙන්ම අයකර ගැනීමකින් තොරව, දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂයන් ඇතුළත් ලේඛනය තුළ දක්වා තිබුණි. ණය ශේෂ අයකර නොගැනීමට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් හා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේද 4.5 හා 6.3 අනුව මේ වන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2023 ජනවාරි 01 දින ලිපි මඟින් අදාළ නිලධාරියා දැනුවත් කර තිබෙන අතර 2023 මාර්තු 07 දින සිහි කැඳවීමක් ද යවා ඇත. ණය ශේෂය පියවීමට කටයුතු නොකළහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව දන්වා ඇති අතර ඉල්ලා අස්වීම දෙපාර්තමේන්තුව විසින් මේ වන තෙක් අනුමත කර නොමැත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ණය ශේෂ නිරවුල් කර නොගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (ii) | අත්තිකාරම් "බී" ගිණුම් සැසැඳුම් ප්‍රකාශයේ ඇමුණුම 3.7 යටතේ දක්වා ඇති සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගේ විස්තරයේ ඇතුළත් කර තිබුණු කාර්යාල කාර්ය සහායකයෙකු 2021 අගෝස්තු 11 දින තනතුර අතහැර ගොස් තිබුණු අතර ඒ වන විට එම නිලධාරියාගෙන් ආපදා ණය රු.229,997ක් සහ විශේෂ අත්තිකාරම් රු.1,585 ක් ලෙස මුළු එකතුව රු.231,582 ක මුදලක් දෙපාර්තමේන්තුවට අයවීමට තිබුණි. එහෙත් ඇමුණුම 3.7 කාල විශ්ලේෂණයේ දක්වා තිබුණේ එම ශේෂය මාස 0-3 අතර සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලෙස වුවද, 2022 දෙසැම්බර් 31 දිනට එම නිලධාරියා සේවය අතහැර ගොස් වර්ෂයකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණි. ඒ අනුව ණය ශේෂ වල කාල විශ්ලේෂණය නිවැරදි නොවන බව නිරීක්ෂණය වූ අතර අත්තිකාරම් "බී" ගිණුම සැසඳුම් ප්‍රකාශයේ 3.7 ඇමුණුමේ සඳහන් විස්තර නිවැරදි නොවීය. එමෙන්ම අයනොවී පවතින එම ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය 4.5 හා 6.3 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මීට පෙර සේවය කළ දෙපාර්තමේන්තුවෙන් ණය ශේෂය පවරා ගැනීම පමණක් සිදුකර ඇත. එබැවින් නිලධාරියාගේ ණය ගොනුවක් නොමැත. 2022 මාර්තු 10 දිනැති ලිපිය මඟින් 2022 අප්‍රේල් 01 දිනට පෙර පියවීමට කටයුතු කරන ලෙස දන්වා යවා ඇත. වැඩිමනත් වශයෙන් 2023 මැයි 10 දින නැවත සිහි කැඳවීමක් යවා ඇති අතර ණය ශේෂය පියවීමට කටයුතු නොකළහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව දන්වා ඇත. | අයවිය යුතු ණය ශේෂ අයකරගත යුතු අතර ඒ පිළිබඳ විස්තර නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම සමඟ ඉදිරිපත් කර තිබුණු 2022 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 3.1 දක්වා තිබෙන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් දැක්වෙන උපලේඛනය, සාමාජික ණය ලේඛනවලට (CC10) අනුරූපීව පිළියෙල කර නොතිබීම නිසා, උපලේඛනයේ දක්වා තිබුණු සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.68,678,013 ක කේවල ණය ශේෂයන් පරීක්ෂා කර නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට විගණනයට නොහැකි විය. | සාමාජික ණය ලේඛන (සීසී10) අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතු හෙයින් වර්ෂ 2 ක කාලයක් සඳහා පාවිච්චියට ගත හැකි ආකාරයට සකස් කරනු ලබන අතර එම කාලපරිච්ඡේදය තුළ දී ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ හා උසස්වීම් ලබන නිලධාරීන් සම්බන්ධයෙන් ඇතැම් විට සීසී10 ලේඛනවල තැබූ ඉඩ ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවීම මත ප්‍රායෝගිකව මෙම ගැටළුකාරී තත්ත්වය මතු වී ඇත. කෙසේ නමුත් සීසී10 හි දැක්වෙන ණය ශේෂය 3.1 ඇමුණුම හා එකඟ වේ. | සැසඳුම් ප්‍රකාශයේ ඇමුණුම 3.1 දක්වා තිබෙන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් දැක්වෙන උපලේඛනය, සාමාජික ණය ලේඛනවලට අනුරූපීව සකස් කළ යුතුය. |

**(ආ) තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අංක 6000-0-0-16-0-47 දරන තැන්පත් ගිණුමේ කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2ත් 5ත් අතර රු. 2,943,234 ක තැන්පතු සහ වර්ෂ 5ට වැඩි රු.105,439 ක තැන්පතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මු.රෙ.571(3) ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි. | අතපසුවීමක් හේතුවෙන් රු.105,439 ක තැන්පතු වර්ෂ 2-5 අතර කල්ගත වූ තැන්පතු ලෙස දක්වා තිබුණි. එම වරද නිවැරදි කිරීම සඳහා උපදෙස් දෙන ලදී. | තැන්පතු සම්බන්ධයෙන් නිවැරදි කාලවිශ්ලේෂණයක් පිළියෙල කර තැන්පතු සැසඳුම් ප්‍රකාශය සකස් කළ යුතු අතර වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ආපසු ගෙවීමට හෝ හිමිකම් නොපාන්නේනම් එම ශේෂ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අංක 6000-0-0-13-0-69 දරන පොදු තැන්පතු ගිණුමේ කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2ත් 5ත් අතර රු.15,419,389 ක තැන්පතු සහ වර්ෂ 5ට වැඩි රු.7,950,594 ක තැන්පතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මු.රෙ.571(3) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් ඉදිරියේ දී නිරවුල් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුව විසින් තැන්පතු සම්බන්ධයෙන් නිවැරදි කාලවිශ්ලේෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ආපසු ගෙවීමට හෝ හිමිකම් නොපාන්නේනම් එම ශේෂ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ මාර්ගෝපදේශ අංක 03 ආකෘතිපත්‍ර 03 හි දැක්වෙන පරිදි වර්ෂ 02ක ට වඩා වැඩි තැන්පතු පැවතීමට හේතු වූ කරුණු සහ ඊට අදාළ වටිනාකම් වෙන් වෙන්ව සඳහන් කළයුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු පොදු තැන්පතු සැසඳුම් ප්‍රකාශය ඉහත මාර්ගෝපදේශය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | මෙම ආකෘති පත්‍ර ප්‍රකාරව තැන්පතු සැසඳුම් ප්‍රකාශය සකස් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛය පරිදි තැන්පතු සැසඳුම් ප්‍රකාශයේ වර්ෂ 2 වැඩි තැන්පතු වෙන් වෙන්ව හා ඊට හේතු වූ කරුණු ද සමඟ ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2022 දෙසැම්බර් 31 දිනට තැන්පතු ශේෂ වල එකතුව වූ රු.103,152,800 සඳහා තැන්පතු වර්ෂය අනුව කේවල ශේෂ ලැයිස්තුවක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඒ හේතුවෙන් තැන්පතු ශේෂ වල පැවැත්ම සහ නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට විගණනයේදී නොහැකි විය. | තැන්පතු ශේෂවල කේවල ශේෂ ලැයිස්තුවක් සකස් කර පවත්වා ගෙන යාම සඳහා නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | තැන්පතු ශේෂ වල කේවල ශේෂ ලැයිස්තුවක් සකස් කළ යුතුය. |

**(ඇ) දේපළ පිරියත හා උපකරණ**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික් ධීවර කාර්යාල 31 ක පිහිටා තිබෙන ඉඩම් පවරාගැනීමට කටයුතු කර නොතිබුණු අතර එයින් කාර්යාල 14 ක ඉඩම්වල මායිම් නිවැරදිව හඳුනාගෙන වැට මායිම් සකස් කිරීමට ක්‍රියාකළ යුතු වුවත් එම දිස්ත්‍රික් කාර්යාල පිහිටි ඉඩම්වල වැට මායිම් සකස් කිරීම සිදුකර නොතිබුණි. | මෙහි සඳහන් ඉඩම් මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමෙන් අනතුරුව වැට මායිම් සකස් කළ හැකි අතර එම කාර්යාල පිහිටි ඉඩම් සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදෙන්නේ නීත්‍යානුකූල අයිතියක් සහිත පැවරුම් සහතිකයක් පමණක් බැවින් එම ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ඉඩම් නිවැරදිව හඳුනාගෙන වැට මායිම් සකස් කිරීම කළ යුතුය. |

**(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛනය** | | |
| | මු.රෙ. 454(2) ප්‍රකාරව විදුලි උපාංග උපකරණ පිළිබඳ බඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. | ලේඛන නඩත්තු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | රජයේ ගොඩනැගිලිවල සියලුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |
| (ii) | **පොත් නාමාවලිය** | | |
| | මු.රෙ. 454(3) ප්‍රකාරව පොත් නාමාවලිය පවත්වා නොතිබුණි. | ලේඛන නඩත්තු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | පොත් හා අනෙකුත් වටිනා ප්‍රකාශන සඳහා තනි ලේඛනයක් තබාගත යුතුය. |

(iii) **වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| මු.රෙ. 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය පවත්වා නොතිබුණි. | ලේඛන නඩත්තු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

(iv) **බැරකම් පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මු.රෙ. 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනය පවත්වා නොතිබුණි. | ලේඛනයක් නඩත්තු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කාර්යමණ්ඩලය, තොරතුරු නිලධාරීන් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදනයන්, තිරසර සංවර්ධන අරමුණු ඉටු කරගැනීමේ ප්‍රගතිය, ආදි විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබු බැවින් අදාළ ක්ෂේත්‍රයන් නිසි ලෙස විගණනය කළ නොහැකි විය. | විස්තර ඉදිරියේ දී ලබාදීමට කටයුතු කරනු ඇත. | විගණනය විසින් ඉල්ලා ඇති තොරතුරු කඩිනමින් ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කටයුතු සහ මිරිදිය ධීවර කටයුතු වල මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට දායකවීම සඳහා ධීවර කටයුතුවල යෙදෙන ධීවරයින් සඳහා ලංකා බැංකුවේ අනුග්‍රහය යටතේ 2011 වර්ෂයේ දී දියවර දිරිය ණය යෝජනා ක්‍රමය ආරම්භ කර තිබුණු අතර 2022 වර්ෂය අවසානයට රු.1,083,390,188 ක්වූ ණය මුදල සඳහා පොලි සහනාධාරය වූ රු.25,044,774 ක මුදල ධීවර දෙපාර්තමේන්තුව විසින් ලංකා බැංකුව වෙත ගෙවා තිබුණි. ධීවරයන්ට ලබා දී තිබුණු ණය මුදල, ණය වාරික ආපසු අයවීම, අයකළ පොලිය, ණය අය නොවන ධීවරයන් සම්බන්ධව ගෙන තිබෙන ක්‍රියාමාර්ග, ණයලාභීන් විසින් මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට දායකවීම පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම යෝජනා ක්‍රමය යටතේ බැංකු ණය නිකුත් කිරීම දේපළ සුරැකුම් මත පමණක් සිදුකළ බැවින්, මේ සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු ගැටලුවක් යොමු වී නොමැත. තව ද මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට දායකවීම පිළිබඳව ඍජු ලෙස පසුවිපරමක් නොවුවද, වක්‍රාකාරයෙන් මේ පිළිබඳව සොයා බැලීමේ දී විදේශ වෙළඳපොළ සඳහා අමුද්‍රව්‍ය වශයෙන් උසස් තත්ත්වයේ ගුණාත්මක මසුන් වැඩි ප්‍රමාණයක්, තත්ත්වයෙන් ඉහළ නැංවූ මෙම යාත්‍රා මඟින් ලබාදෙන ලදී. තව ද මෙම වැඩසටහන පිළිබඳව පසුවිපරමක් සිදුකිරීමේ අවශ්‍යතාවය සාකච්ඡා මට්ටමේ පවතින අතර, ඉදිරියේ දී එය දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. | ධීවරයන්ට ලබා දී තිබුණු ණය මුදල, ණය වාරික ආපසු අයවීම, අයකළ පොලිය, ණය අයනොවන ධීවරයන් සම්බන්ධව ගෙන තිබෙන ක්‍රියාමාර්ග, ණයලාභීන් විසින් මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට දායකවීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 7002-0-0-257-0-22 දරන අග්‍රිම ගිණුමේ සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ අග්‍රිමය රු.1,053,542,000 ක් වුවද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.513,882,000 ක් විය. එබැවින් අග්‍රිම සැලසුම් කිරීම මඟින් අපේක්ෂා කර තිබුණු ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම, දේශීය හා ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙළීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය හා සුරක්ෂිතභාවය, අන්තර්ජාතික ප්‍රඥප්ති හා කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් කටයුතු සිදුකිරීම, පසුඅස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම වැනි ප්‍රධාන අරමුණු ඉටු වී නොතිබුණු අතර පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කළ නොහැකි වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ තත්‍ය අවශ්‍යතාවය පදනම් කරගෙන අග්‍රිම සැලසුම් කළ ද අක්මුදල් හිඟය හා වියදම් කළමනාකරණය මත සීමිත පදනමින් අග්‍රිම ලබා දී ඇත. | නිවැරදි හා තාත්වික ලෙස අග්‍රිම සැලසුම් සකස් කර දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.2 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023 පෙබරවාරි 10 දින විගණකාධිපතිට පිටපතක් සහිතව භාණ්ඩාගාරය වෙත යොමුකර තිබුණු අංක 10.03.07.06 දරන ආදායම් ශීර්ෂයට අදාළ 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාවට අනුව රු.3,503,339 ක | මෙම 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා DFAR/F/4/1/Department Rev./2022/2023 දරන ලිපිය අනුව හිඟ ආදායම් ලෙස දක්වා ඇති රු.3,503,339 ක මුදල අදාළ කාල සීමාව අවසන් වීමෙන් පසු බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුවක් ලෙස අයකර ගැනීම සඳහා දැනට නිකුත් කර ඇති ගැසට් පත්‍ර මඟින් විධිවිධාන සලසා නොමැති හිඟ ආදායමක් ලෙස | හිඟ ආදායම් නියමිත ආකෘතිය අනුව ඇතුළත් කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හිඟ බලපත්‍ර ආදායමක් පැවතිය ද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ1(i)) සදොස් ලෙස එය රු.11,000 ක් වශයෙන් සඳහන් කර තිබුණි. | දෙපාර්තමේන්තුවට ඉදිරියේ දී අයකර ගැනීමට හැකියාවක් නොමැති ආදායම් වේ. ඒ අනුව 2022 වර්ෂය අවසන් වීමෙන් පසු එම වර්ෂයට අදාළ හිඟ ආදායමක් ලෙස අයකර ගත නොහැකි බැවින් මූල්‍ය ප්‍රකාශනවල නොදක්වන ලදී. | |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනය (ඒසීඒ-1(i)) අනුව 2022 වර්ෂයේ ආරම්භක දිනට 2021 වර්ෂය සඳහා රු.266,000 ක්ද, 2020 වර්ෂය සඳහා රු.8,494,000 ක් වශයෙන් එකතුව රු.8,760,000 ක හිඟ ආදායමක් වූ අතර 2021 හා 2020 වර්ෂය වෙනුවෙන් හිඟ ආදායම් පිළිවෙලින් රු.99,000 ක් හා රු.48,000 ක් වශයෙන් එකතු වටිනාකම රු.147,000 ක් පමණක් සමාලෝචිත වරෂයේදී අයකරගෙන තිබුණු බැවින් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 1.67 ක් පමණ ඉතාම දුර්වල මට්ටමක පැවතුණි. තව ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමස්ත හිඟ ආදායම රු.9,916,000 ක් වූයෙන් හිඟ ආදායම් එකතුකිරීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | මෙම හිඟ ආදායම් අයවීම් යාත්‍රාංගන ලියාපදිංචිය සහ ධීවර ආම්පන්න සැපයුම්කරුවන් ලියාපදිංචියට අදාළ වේ. කෙසේ වුවද එම හිඟ ආදායමින් රු.8,325,500 ක් හිඟ ආදායම් ලෙස අය කළ නොහැකි අතර ඒ බව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ MOF/F/1/7/21/DFAR අංක හා 2023 පෙබරවාරි 28 දිනැති ලිපිය මඟින් දැනුවත් කර ඇත. ඒ අනුව සත්‍ය වශයෙන් හිඟ ආදායම ලෙස රු.407,500 ක් මුදලින් රු.147,000 ක් අයකර ගෙන ඇති බව හා ඉතිරි හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඇ) | 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යවරයා විසින් සකස් කර 2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර තිබෙන නියෝග ප්‍රකාරව එහි i වැනි උපලේඛනයේ සිට iv වැනි උපලේඛනය දක්වා සඳහන් සංශෝධිත බලපත්‍ර ගාස්තු කාණ්ඩ 53 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ රු.185,602,364 ක ආදායමක් එකතු කර තිබුණ ද, මෙම බලපත්‍ර විශේෂිත කඩදාසියක, විධිමත් ආකෘතියක සහ පූර්ව අංකනයක් සහිතව බලපත්‍ර අවභාවිතය වැළැක්වීම සඳහා ඉඩකඩ | දෙපාර්තමේන්තුවේ සෑම අංශයක් මඟින්ම ලබාදෙන බලපත්‍ර හා රැස්කරන ආදායම මාසිකව සංසන්දනය කරනු ලැබේ. ඒ අනුව රජයට ආදායමක් නොමැතිව බලපත්‍ර නිකුත් කිරීම අවම කිරීම සඳහා උපරිම අභ්‍යන්තර පාලන ක්‍රමයක් යොදා ඇති බැවින් මෙම තත්ත්වය තවදුරටත් විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද යොදාගෙන Payment Gateway ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වළක්වාලමින් වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමක් සිදුකර නොතිබෙන බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | මු.රෙ. 177(1) ප්‍රකාරව එකතු කරගන්නා මුළු මුදලම දිනපතා හෝ හැකිතාක් කලින් බැංකු ගත යුතු බව සඳහන් කර තිබුණ ද, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල 5 ක අවස්ථා 13කදී රු.5,599,973 ක දෛනික ආදායම් ගිණුම්ගත කිරීමේ දී දින 01 සිට දින 04 දක්වා කාල ප්‍රමාදයන් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවල සෑම දිනකම සවස 3.00 වන තෙක් මුදල් රැස්කිරීම සිදුවන නිසා එම ආදායම් එදිනම බැංකුගත කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැක. කෙසේ වෙතත් මු.රෙ. 177(1) ප්‍රකාරව එකතුකර ගන්නා රජයේ මුදල් එදිනම හෝ හැකිතාක් කලින් බැංකුගත කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කරන ලදී. | මුළු මුදලම දිනපතා බැංකුගත කළ යුතුය. |

**2.3 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 2 ක් සඳහා සලසාගෙන තිබුණු රු.12,300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.9,089,081 ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 54 ත් සියයට 75 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි. | 290-1-1-5-2202-0/11- වැය ශීර්ෂය ධීවරයින් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වේ. රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් අපේක්ෂිත පරිදි ක්ෂේත්‍රයට ගොස් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.<br><br>290-1-1-2506-0/11- වර්ෂය තුළ පැවති උග්‍ර ඉන්ධන හිඟය හා කෝටා ක්‍රමයට ඉන්ධන නිකුත් කිරීම නිසා දකුණු මුහුදේ සිට උතුරු මුහුද දක්වා ප්‍රවාහන කටයුතු සහ ගොඩබිමේ සිට බස් රැගෙන යාම අපහසුවීම නිසා වර්ෂයේ මුල් කාර්තු තුනෙහි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි විය. | නිවැරදිව හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

**2.4** බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) ආකෘතියේ බැරකම් ශේෂය රු.6,735,774 ක් වන අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 92 වාර්තාව අනුව භාණ්ඩාගාරය විසින් අනුමත කර ඇති බැරකම් ශේෂය රු.64,605,199 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල බැරකම් විස්තරය හා භාණ්ඩාගාර බැරකම් විස්තරය අතර රු.57,869,425 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය වෙත වාර්තා කළ රු.57,869,425 ක වටිනාකමින් යුත් බැරකම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) ආකෘතිය සඳහා ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේ දී බැරකම් වාර්තාවේ අගය SA 92 වාර්තාවේ වටිනාකම් හා සංසන්දනය කරමින් නිවැරදිව වාර්තා පවත්වාගෙන යන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. | භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇති බැරකම් සියල්ල මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) ආකෘතිය සඳහා ඇතුළත් කළ යුතුය. |
| (ආ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA92 වාර්තාවේ බැඳීම් හඳුනාගෙන තිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි බැඳීම් හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේ දී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් දෙන ලදී. | දෙපාර්තමේන්තුව විසින් හඳුනාගන්නා ලද බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (iii) බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි බැඳීම් යටතේ හඳුනාගත යුතුය. |
| (ඇ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් හෝ අලුතින් ඇති කරන ලද වැය විෂයයක් හෝ නොවන අංක 290-1-1-0-1504-11 දරන වැය විෂයය යටතේ රු.1,425,433 ක බැරකම් දක්වා තිබුණි. | මෙය ධීවර දෙපාර්තමේන්තුව හා ලංකා බැංකුව එක්ව ධීවරයන් වෙත ලබාදෙන ණය පහසුකමක පොලී ගෙවීම හා සම්බන්ධ වේ. | වාර්ෂිකව අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් වැය විෂයයන් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල බැරකම් යටතේ පෙන්නුම් කළ යුතුය. |
| (ඈ) | දියවර දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ කරදිය ධීවර ප්‍රජාවට දී තිබුණු ණය සඳහා 2022 ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාසවල ගෙවිය යුතු පොලී සහනාධාරය වූ රු.3,955,536 ක බැරකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල පෙන්වා නොතිබුණි. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දී ඇතිකර ගන්නා බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කළ යුතුය. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 371 (4) ප්‍රකාරව නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු බව සඳහන් වුවද අවස්ථා 6 කදී ප්‍රධාන කාර්යාලය විසින් ලබා දී තිබුණු රු.80,277 ක සුළු මුදල් අතුරු අග්‍රිම සහ තත්කාර්යය අතුරු අග්‍රිම කිසිදු කාර්යයක් සඳහා නොයොදා, දින 04 සිට මාස 11 දක්වා කාල පරාසයක් රඳවාගෙන මුළු මුදලම ආපසු තැන්පත් කර තිබුණි. | මෙහි සඳහන් අතුරු අග්‍රිම ගෙවීම් සියල්ල මේ වන විට මුදලින් හා වවුචර් මඟින් පියවා ඇත. | අවශ්‍යතාවය අනුව අග්‍රිම ලබාගත යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මු.රෙ. 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයන් නිකුත් කිරීමෙන් පසුව අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම නැවත පියවිය යුතු වුවත්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේ ලබා දී තිබුණු අතුරු අග්‍රිම පිළිබඳ නියැදි පරීක්ෂාවකට අනුව අතුරු අග්‍රිම පියවීම් සඳහා දින 16 සිට දින 115 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත අග්‍රිම පියවන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | අතුරු අග්‍රිම පියවීම නියමිත කාල වකවානු තුළ දී සිදුකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 290-1-1-2001 මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් වෙනුවෙන් රු.5,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණු අතර පසුව මු.රෙ. 66 ප්‍රකාරව තවත් රු.281,000 කින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි. 2022 ඔක්තෝබර් 20 දිනැති 2022 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව රු.5,200,000 ක් ගොඩනැගිලි ඉදිකිරීම් හා පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම් සඳහා සැලසුම් කර තිබුණි. භාණ්ඩාගාරයේ මුද්‍රිත සටහන් **SA** 10 ප්‍රකාරව | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාවේ ඇතුළත් කළ යුතුය. |

ඉහත වැය විෂයයේ වියදම රු.5,240,360 ක් වූ අතර, එම ප්‍රතිපාදන යොදවා තිබුණේ 2021 වර්ෂයේ නිම කර තිබුණු පුනරුත්ථාපන හා ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් නොගෙවූ බිල්පත් පියවීම සඳහාය. ඒ අනුව වාර්ෂික ඇස්තමේන්තු හා ප්‍රසම්පාදන සැලැස්ම යථාර්ථවාදී නොවීය.

### 3.2 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම(i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 06 වන මහලේ ජලය කාන්දු වීමක් නිසා සිදු වී තිබූ රු.16,519,961ක හානිය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි. මේ අනුව මු.රෙ. ප්‍රකාර කටයුතු කර නොතිබුණු අතර අලාභයට වගකිව යුත්තේ කොන්ත්‍රාත්කරු වන බව පැහැදිලිව හඳුනාගෙන තිබුණ ද රජයට සිදු වී තිබුණ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ධීවර අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කාර්යයන් නිසා 6 වන මහලට ජලය කාන්දුවීමක් නිසා සිදු වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණයක් සිදුකිරීමට 2023 අප්‍රේල් 24 වන දින නිලධාරීන් 03 දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර ඇත. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකරගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛනයේ වාර්තා කර ඇති හානි හා පාඩු 6 ක් පිළිබඳ විස්තර සම්පූර්ණයෙන් යාවත්කාලීන කර නොමැති අතර එම හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම (i) හි පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයේ ද ඇතුළත් කර නොතිබුණි. | එම හානි හා පාඩු වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් වූ සිදුවීම්ය. එම වාහන අනතුරු විටින් විට හානි පිළිබඳ ලේඛනයෙන් කපා හැර ඇත. | දෙපාර්තමේන්තු විසින් පවත්වාගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතුය. |